# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2332/24 – 2023 මැයි මස 18 වැනි බ්‍රහස්පතින්දා – 2023.05.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2021/45.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.09.30 දිනැති හා අංක 2299/63 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.09.19 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 06, කිරුළපන, බලපොකුණ පාර, අංක 62 හි පදිංචි පී. පී. පීරිස් මයා සහ කොළඹ 05, නාරාහේන්පිට, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.03.24 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 මැයි මස 03 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 039512 – 11 (2023/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය**

පී. පී. පීරිස්,
අංක. 62,
බලපොකුණ පාර, කිරුලපණ,
කොළඹ 06.
(ඉල්ලුම්කරු)

*(පළමු පාර්ශ්වය)*

යොමු අංකය: IR/COM/01/2021/45.
නඩු අංකය: A/50/2022.

*එදිරිව*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200 කිරුළ පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.
( වගඋත්තරකරු)

*(දෙවන පාර්ශ්වය)*

**පෙනී සිටීම :-**

දෙවන පාර්ශ්වය වෙනුවෙන් - ආයතනයේ නීති නිලධාරි දිමුතු පනංගල මහත්මිය සහ නීතිඥ හාජර් අසාර් මැතිණිය පෙනී සිටින ලදී.

**ප්‍රදානය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදයේ (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2022.09.19 දිනැති නියෝගයේ බේරුම්කරුවකු වශයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

<u>ආරාවුලට හේතු වී ඇති කරුණු</u>

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝග ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය ලෙස කම්කරු කොමසාරිස් ජෙනරාල් විසින් 14.09.2022 එවා ඇති ලිපියේ දැක්වෙන්නේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කළ පී. පී. පීරිස් මහතාට විශ්‍රාම යාමට පෙර හිමි ත්‍රෛමාසික නිවාඩු නොලබා සේවය කිරීම මත ඒ සඳහා වන තුන්මසකට හිමි වැටුපට සමාන දීමනාව යන්න හා ඔහුට හිමි සහනයන් කවරේද යන්නය.

<u>පෙනී සිටීම සහ බේරුම්කරණ විභාග පටිපාටිය</u>

මෙම පරීක්ෂණය 2022/10/04 දින මුල්වරට කැඳවන ලද දිනයේ සිට බේරුම්කරණ විභාගය අවසන් කරන ලද කාලය තුල සෑම දිනකම දෙපාර්ශවයම පැමිණ සිටින ලදී. 10/01/2020 ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නීති නිලධාරිනී වෙනත් නඩුවක් සම්බන්ධයෙන් යැමට සිදු වීමෙන් සහ රජයේ නීතිඥවරියට වෙනත් කටයුත්තක් සඳහා පැමිණීමට නොහැකි බව දන්වා මෝසමක් ඉදිරිපත් කර ඇත. එම කරුණු මත වෙනත් දිනයක් (23/01/2023) දිනය ලබා දී ඇත. වග උත්තරකාර පාර්ශ්වය 23/01/2023 දින සහකාර මානව සම්පත් කළමනාකාරිණි යමුණා දහනායක මහත්මියගේ සාක්ෂි සහ ප්‍රකාශ ලබා ගන්නා ලදී. එදින වගඋත්තරකාර පාර්ශ්වය පැමිණිලිකරුගෙ

න් ප්‍රශ්න අසා සටහන් කර ගන්නා ලදී. 23/01/2023 වගඋත්තරකාර පාර්ශ්වය 23/01/2023 සාක්ෂිකරුගෙන් නැවත අධිකරණයෙන් ප්‍රශ්න අසා පරීක්ෂණය නිම කරන ලදී. පරීක්ෂණයේදී මාසික වැටුප යනු ඒකාබද්ධ වැටුපද මූලික වැටුපද යන්න 1987 අංක 3 දරන චක්‍රලේඛනයේ සඳහන් කර ඇත්තේ යම්යම් අවස්ථාවලදී පමණක් බව සඳහන් කර ඇතත් ඊට පරිබාහිරව වූයේ වැටුප යනු ඒකාබද්ධ වැටුප යනුයි. පැමිණිලිකරුගේ ලිඛිත ලේඛන ඉදිරිපත් කිරීමේදී සඳහන් කර ඇත්තේ ඒකාබද්ධ වැටුපට පාරිතෝෂික ගෙවූ බවයි.

<u>ප්‍රදානය</u>

(1). සාක්ෂිකාරිය යම් අවස්ථාවන්හි වැටුප පිළිබඳ ප්‍රශ්න කිරීමේදී ඉදිරිපත් කළ සටහන්වල වැටුපක් වෙනුවෙන් එය මූලික වැටුපද නැතහොත් ඒකාබද්ධ වැටුප ද ලෙස සඳහන් වී නොමැත.

(2). සේවයෙන් ඉල්ලා අස්වන විධායක නිලධාරීන්ට බවත්, චක්‍රලේඛනය අනුව සමස්ථ සේවකයින්ගේ කියලා චක්‍රලේඛනයේ තිබෙන්නේ.

(3). ඉල්ලා අස්වන සේවකයකුට මාස කීයක වැටුප් ගෙවනවාද ප්‍රශ්නයට පිළිතුරට දන්නේ නැත කියා සාක්ෂිකාරිය පිළිතුරු දී ඇත.

(4). පැමිණිලිකරු විශ්‍රාම යාමට පෙර ත්‍රෛමාසිකව නිවාඩු ලබා ගැනීමට නොහැකි වූයේ ලිපි අංක ශ්‍රී ලංගම/ මාසක/ සුසා ත්‍රෛනි/72/01/2016 25/02/2016 දිනැති ලිපියේ ඉල්ලුම්කරුට හිමි නිවාඩු ලබා දිය නොහැකි බවත් සහ 2017/05/08 දිනැති අංක ශ්‍රීලංගම/ නිසා(පාලන) විශ්‍රා/2017 අංක දරන ලිපියේත් ඉල්ලුම් කරුගේ ත්‍රෛමාසික නිවාඩු අනුමත කළ නොහැකි බවත්ය.

(5). සහකාර කොමසාරිස්ගේ 2019/12/06 දිනැති අංක දරන CLE/COM/D09/450/2019/16 දන්වා තිබෙන්නේ අයදුම්කරුට එකී තුන්මසක හිමි වැටුප හිමි විය යුතු බව සහ එය ගෙවීමට කටයුතු කරන ලෙසට ද දන්වා සිටින ලද බවය.

(6). මෙම පරීක්ෂණය අවසානයේ පෙනී යන්නේ පැමිණිලිකරුට හිමි තුන්මසක ඒකාබද්ධ වැටුප ගෙවන ලෙසට පහත සඳහන් පරිදි වේ.

<u>ප්‍රදානය</u>

1. ඉල්ලුම්කරු විසින් ඉල්ලුම් කරන ලද ත්‍රෛමාසික වැටුප වන රුපියල් දෙලක්ෂ හතලිස් හයදහස් පන්සිය අසූහතයි ශත දෙකක් පමණි (රුපියල් 246,587.02)

2. රුපියල් 246,587.02 ක මුදල හැර අමතර කිසිදු මුදලක් කිසිම පාර්ශ්වයකට හිමි නොවේ. තවද බේරුම්කරනයේ විභාගයට සම්බන්ධ ගාස්තු හෝ වෙනත් වියදමක් එක් පාර්ශ්වයකින් තවත් පාර්ශ්වයකට හිමි නොවේ.

3. එම ප්‍රදානය අනුව ගෙවිය යුතු සම්පූර්ණ මුදල වන රුපියල් 246,587/02 (රුපියල් දෙලක්ෂ හතලිස් හයදහස් පන්සිය අසූහතයි ශත දෙකක්) කොළඹ නැගෙනහිර සහකාර කොමසාරිස් කාර්යාලයේ කොමසාරිස් නමින් තැන්පත් කරන ලෙසට මෙයින් නියෝග කරමි. මෙම ප්‍රදානය රජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට මසක් ඇතුලත තැන්පත් කළ යුතුය.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බවට ප්‍රකාශ කරමි.

කපිතාන් එම්. ජී.ජී.මෙන්ඩිස්,
බේරුම්කරු.

2023 මාර්තු මස 25 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

**<u>ත්‍රෛමාසික වේතනය සැකසීම</u>**

යොමු අංකය : IR/COM/01/2011/45
නඩු අංකය : A/50/2022

| | | |
|---|---|---|
| | **පී. පී. පීරිස්** | |
| 2018.09.01 දිනට මූලික වේතනය | 37,065.00 | |
| 2019.04.22 අවු. 30 සේවා කාලය සඳහා විශේෂ වේතන වර්ධක 03 | | |
| (රු. 1100.00 x 03 = රු. 3300/-) | 3,300.00 | |
| 2019.04.22 දිනට මූලික වේතනය | | 40,365.00 |
| දීමනා | | |
| ජීවන වියදම් දීමනාව | 7.800.00 | |
| අනෙකුත් දීමනා | 23,309.50 | |
| සම්පූර්ණ දීමනා වල එතුව | | 31,109.50 |
| 2019.04.22 දිනට සම්පූර්ණ මාසික වේතනය | | 71,474.50 |
| මාස 03ට අදාල සම්පූර්ණ වේතනය | | 71,474.30 x 03 |
| | | 214,423.50 |
| ආයතනය විසින් බැර කළ යුතු සේවක අර්ථ සාධක දායක මුදල (12%) | | |
| මාස 3 ට අදාල සම්පූර්ණ වේතනය | | 214,423.50 x 12% |
| | | 25,730.82 |
| බැර කළ යුතු සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල (03% ) | | |
| මාස 3 ට අදාල සම්පූර්ණ වේතනය | | 214,423.50 x 03% |
| | | 6,432.70 |
| මාස 3 ට අදාල සම්පූර්ණ වේතනය | | 214,423.50 |
| ආයතනය විසින් බැර කළ යුතු සේවක අර්ථ සාධක දායක මුදල (12%) | | 25,730.82 |
| බැර කළ යුතු සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල (03%) | | 6,432.70 |
| හිමි විය යුතු සම්පූර්ණ මුදල | | 246,587.02 |

කපිතාන් එම්. ජී. ජී. මෙන්ඩිස්,
බේරුම්කරු.

2023 මාර්තු මස 25 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

EOG 05 - 0130